# දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවකයින් ලබා ගැනීම

❖ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා <u>ශිල්පීය දැනුම ඇති සේවකයින් සේවා අවශ්‍යතාවය පවතින දින වලදී පමණක්</u> සේවයට කැඳවීමට යටත්ව, වසරක කාලයකට ගිවිසුම්ගතව, ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරනු ලබන අයදුම්පතක් ඉදිරිපත් කල යුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රම මිලදී ගැනීම- (අදාල තනතුර සඳහන් කරන්න)" ලෙස සඳහන් කර **2024.03.04** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලුපාර, දෙහිවල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (අදාල අයදුම් පත්‍රය www.dmmc.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක)

1. ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීමට අපේක්ෂිත තනතුරු

   ❖ වාහන විදුලි කාර්මිකයින් 01
   ❖ පැස්සුම්කරුවන් 01
   ❖ වාහන පින්තාරුකරුවන් 01

2. දීමනාව - වැඩකරන එක් දිනක් සඳහා රු **3750/-** කි.
   (ගිවිසුම අත්සන් කිරීමට පෙර කොළඹ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාවේ විය හැකි සංශෝධනයන්ට යටත්ව)

3. සුදුසුකම් -

   * අදාල තනතුරට නියමිත පරිදි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

   හෝ

   * රජයේ හෝ පෞද්ගලික අංශයේ, තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

4. වෙනත් සුදුසුකම්

I. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි. රජයේ රෝහලකින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

II. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

III. වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 65 ට නොවැඩි විය යුතුයි.

IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කල යුතුය. (දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් පදිංචිය සනාථ කල යුතුය.)

V. අයදුම්කරු විනය විරෝධී විෂමාචාර ක්‍රියාවන්ට සම්බන්ධ වී නොමැති බව සනාථ කිරීමට, පදිංචිය අයත් පොලිස් වසමේ පොලිස් ස්ථානයෙන් නිකුත් කරන ලද පොලිස් සහතිකයක් ඉදිරිපත් කල යුතුයි.

5. බඳවා ගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් අයදුම්කරුවන් පහත කොන්දේසිවලට යටත්ව සේවය සඳහා යොදවා ගනු ලැබේ.

I. නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන සියළුම අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කර තනතුරට අදාල ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරන අතර, අනතුරුව සුදුසු අයදුම්කරුවන් හඳුනා ගනු ලැබේ.

II. එසේ හඳුනා ගනු ලබන සුදුසුකම් සහිත අයදුම්කරුවන් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ලියාපදිංචි කර ගනු ලැබේ.

III. ඔවුන් අතුරින් අවශ්‍ය සේවකයින් අවශ්‍යතාවය පවතින දින වලදී පමණක් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සමග එළඹෙන ගිවිසුමකට යටත්ව සේවය සඳහා කැඳවනු ලැබේ.

IV. ගිවිසුමට එළඹීමට පෙර, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් නියම කරනු ලැබුවහොත්, ඇප කොන්දේසි වලට යටත්ව රු.10000/-ක ඇපයක් තැබීමට ඔබ බැඳී සිටිය යුතුයි.

V. දිනකට අවම පැය 08ක කාලයක් සේවයේ යෙදිය යුතුය.

VI. පූර්ණ කාලීනව රාජකාරීන් හි නියැලිය යුතුය.

VII. මසක් තුල ඔබ වැඩ කරන දින ගණන සඳහා අදාල දීමනාව ඊළඟ මස 10 වන දිනට පෙර ගෙවීම් කරනු ලබයි.

VIII. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලබනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුයි.

IX. <u>සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සහතික ඉදිරිපත් කල යුතුයි.</u>

* රජයේ රෝහලකින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකය (මුල් පිටපත)
* ග්‍රාම නිලධාරී සහතිකය (මුල් පිටපත)
* උප්පැන්න සහතිකය (මුල් පිටපත සහ සහතික කල පිටපත)
* ජාතික හැඳුනුම්පත (මුල් පිටපත සහ සහතික කල පිටපත)
* පදිංචි වසමට අදාල පොලිස් ස්ථානය විසින් නිකුත් කල පොලිස් සහතිකය (මුල් පිටපත)
* පළපුරුද්ද සනාථ කිරීමට අදාල සහතික (මුල් පිටපත්)

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **<u>2024.03.04</u>** වේ. එදිනට ඉහත කී සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුයි.

7. අදාල සේවා ලබා ගැනීම හෝ නොගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

**එම්.එම්.සී.කේ.කේ.මාන්නප්පෙරුම**
**නාගරික කොමසාරිස් සහ,**
**බලතල, කාර්යය, කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී**
**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලු පාර, දෙහිවල.**
**2024.02.09**

**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ**

**.................................. තනතුර සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවයේ**

**යෙදවීමේ අයදුම්පත්‍රය**

## 1. ජීව දත්ත තොරතුරු :

1.1. මුලකුරු සමග නම (උදා- ඒ.බී.සී.සිල්වා) :

..........................................................................................................................................

1.2. සම්පූර්ණ නම :

..........................................................................................................................................

..........................................................................................................................................

1.3. ස්ථිර ලිපිනය :

..........................................................................................................................................

..........................................................................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5. දුරකථන අංකය : ..........................................................................................

1.6. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

1.7. **2024.03.04** දිනට වයස : අවුරුදු ...................... මාස ...................... දින ......................

## 2. දැන්වීමේ අංක 3 හි සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**අයදුම්කරුගේ සහතිකය :**

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම රාජකාරී සඳහා යොදවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ඒ සඳහා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, රාජකාරී සඳහා යෙදවීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් හෝ ඇප මුදල් ආපසු නොගෙවා ගිවිසුම අවසන් කිරීමට යටත් වන බවත් මා දනිමි.

.......................................... 
දිනය

.................................................... 
අයදුම්කරුගේ අත්සන

සැ.යු. :- **නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**